Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019-10-30

පැමිණිලි පාර්ශවය : ජේ.එම්.අයි. නුවන්ගනි මිය,
අංක. 65/65, තල්වත්ත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පතිතුමිය,
මහ/මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02. විදුහල්පතිතුමිය,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

(සභාපති, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
මහ/මහාමායා බාලිකා විද්‍යාලය)

<u>පැමිණිලි අංකය : HRC/K/12/18</u>

පැමිණිල්ල :-

ඉහත නම් දරණ පැමිණිලි පාර්ශවය 2017.12.26 දාතමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සැළකර ඇත්තේ, තම දියණිය වන නෙසුකි සෙනායා විජේවික්‍රම යන අය 2018 වර්ෂයේ මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා R 109 යටතේ කැඳවුම් ලබා 2018.09.13 පැවැති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට සියලු සුදුසුකම් සපුරන ලද නමුත් ඇය එම විද්‍යාලයට තෝරා නොගත් බවයි.

මෙහිදි පැමිණිලි පාර්ශවය සම්මුඛ පරීක්ෂණයේදි හිමි කරගත් ලකුණු ප්‍රමාණය ලකුණු 92 ක් වන අතර ආසන්නතා පදනම යටතේ විද්‍යාලයට ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමේ අවම කඩඉම් ලකුණ 82 ක් වන නමුත් පැමිණිලි පාර්ශවයේ පදිංචිය තහවුරු නොවීම හේතු වශයෙන් දක්වමින් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ නම තාවකාලික ලේඛනයට හෝ තෝරාගනු ලබන්නන්ගේ අවසන් නාම ලේඛනයට හෝ ඇතුළත් කර නොමැති බවද දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

කෙසේ වෙතත් තමන් මෙම ලිපිනයෙහි ස්ථිර පදිංචිකාරියක වන නමුත් වගඋත්තර පාර්ශවය වෙත ලැබී ඇති ව්‍යාජ තොරතුරු මත පදනම් වෙමින් පදිංචිය තහවුරු නොවීම මත තම දියණිය විද්‍යාලයට ඇතුළත් කර නොගත් බව පැමිණිලි පාර්ශවය වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද සම්මුඛ පරීක්ෂණයේදී සියලු සුදුසුකම් සපුරා ලකුණු 92 ක් හිමිකරගත් තම දියණියගේ නම තාවකාලික ලේඛනයේ ඇතුළත් නොවීම මත පැමිණිලි පාර්ශවය අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය හමුවේ අභියාචනයක්ද ගොනු කරන ලද බවත් එහිදිද තම පදිංචිය හෝ අන් කරුණක් සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් ඇති නොවූ බව පැමිණිලිකාරිය දක්වා ඇත.

මේ අනුව පැමිණිලි පාර්ශවය කොමිෂන් සභාව හමුවේ ගොනු කළ පැමිණිල්ල තුළින් තවදුරටත් දන්වා ඇත්තේ, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 92 ක් හිමිකරගත් එමෙන්ම අභියාචනා හා විරෝධතා පරීක්ෂණයේදීද එම ලකුණු ප්‍රමාණය එලෙසින්ම රැකගත් තම දියණිය මෙසේ පදනම් විරහිතව වගඋත්තර පාර්ශවීය විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම අසාධාරණ වන බවය.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-

පැමිණිලි පාර්ශවයේ උක්ත පැමිණිල්ල සැළකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවීය මහ/මහාමායා බාලිකා විද්‍යාලය සිය කරුණු දැක්වීම මඟින් සඳහන් කර ඇත්තේ, අදාළ පැමිණිලිකාරියගේ දියණිය 2018 වර්ෂය සඳහා එම විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා 109 යටතේ තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට එහිදී ලකුණු 92 ක් හිමි කරගෙන ඇති නමුත් පදිංචිය තහවුරු නොවීමේ හේතුව මත අදාළ දියණිය විද්‍යාලයට ඇතුළත් කර නොගත් බවයි.

වගඋත්තර පාර්ශවය විසින් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව තාවකාලික ලේඛනය සැකසීමට ප්‍රථමයෙන් 2017.10.10 දින ස්ථාන පරීක්ෂාවක් සිදු කර ඇති අතර, එහිදී පැමිණිලිකාරියගේ සහෝදරිය අදාළ නිවසෙහි සිට ඇති බවත් පැමිණිලිකාරිය ගම්පහ ප්‍රදේශයේ සේවය කරන බැවින් ඔවුන් ගම්පහ ප්‍රදේශයේ පදිංචිව සිටින බවත් ඇය මෙතෙක් වේලා නිවසේ රැදී සිට පිටත්ව ගිය බවත් ඇය විසින් සැළ කරන ලද බවත් සඳහන් කර ඇත. තවද ප්‍රදේශවාසීන් විසින්ද පැමිණිලිකාරිය මෙම නිවසෙහි පදිංචිව නොසිටින බව දන්වන ලද බවද සඳහන් කර ඇත. මේ අනුව පදිංචිය තහවුරු නොවීම හේතුවෙන් පැමිණිලිකාරියගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් නොකිරීමට තමන් වගබලා ගත් බව වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් දන්වා ඇත.

මෙසේ තාවකාලික ලේඛනයට තම නම ඇතුළත් නොවීම හේතුවෙන් පැමිණිලි පාර්ශවය ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එහිදී අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් ස්ථාන පරීක්ෂාවක් සිදුකර ඇත. කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීමට අනුව එම අවස්ථාවේ පැමිණිලිකාරිය, ඇයගේ දියණිය, පැමිණිලිකාරියගේ සහෝදරිය සහ ඇයගේ දරුවන් යන පාර්ශවයන් එම නිවසේ සිටිනු නිරීක්ෂණය වුව ද එම නිවසේ කිසිසේත්ම එවැනි පවුල් දෙකක් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බව වගඋත්තර පාර්ශවය නිරීක්ෂණය කර ඇති බවද දක්වා ඇත. එම

අවස්ථාවේදීද ප්‍රදේශවාසීන් වෙතින් විමසීමේදී පැමිණිලිකාරිය මෙම නිවසේ පදිංචිකාරියක නොවන බවට අනාවරණ වූ බවද දක්වා ඇත.

ඒ අනුව එම අවස්ථාවේදීද පැමිණිලි පාර්ශවයේ පදිංචිය තහවුරු නොවූ බැවින් අභියාචනා හා විරෝධතා මණ්ඩලය පැමිණිලිකාරියගේ නම අවසන් නාම ලේඛනයට ඇතුළත් නොකිරීමට පියවර ගෙන ඇති බවද දක්වා ඇත.

කෙසේ වෙතත් වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් දන්වා ඇත්තේ, මේ පිළිබඳ දැනුවත් කිරීම සඳහා පැමිණෙන ලෙස දැනුම්දීම පිණිස 2017.12.12 දින පැමිණිලිකාරිය දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට උත්සහ කළද එය සාර්ථක නොවූ බවයි. පසු දින එනම් 2017.12.13 වන දින ඇය දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට හැකි වූ බවද 2017.12.14 වන දින ප.ව. 1.00 ට වගඋත්තරකාර පාර්ශවය හමුවන ලෙස දැනුම්දුන්නද පැමිණිලිකාරියගේ නොපැමිණීම හේතුවෙන් ඇයගේ පදිංචිය තහවුරු නොවන බව වගඋත්තර පාර්ශවය වෙත තවදුරටත් ප්‍රත්‍යක්‍ෂ වූ බවද දක්වා ඇත.

යතෝක්ථ සියලු සංසිද්ධීන් සැළකිල්ලට ගනිමින් පදිංචිය තහවුරු නොවීමේ හේතුව මත මෙම පැමිණිලිකාරියගේ දියණිය විද්‍යාලයට ඇතුළත් කර නොගැනීමට තීරණය කළ බව වගඋත්තර පාර්ශවය සිය කරුණු දැක්වීම තුළින් අවසාන වශයෙන් සැළකර ඇත.

නිරීක්‍ෂණ හා නිගමනයන් :-

දෙපාර්ශවයේ ලිඛිත කරුණු දැක්වීම් සැළකිල්ලට ගනිමින් 2018.02.08 දින කොමිෂන් සභාව විසින් පැවැත්වූ මූලික විමර්ශනයට අනුව, පැමිණිලි පාර්ශවයේ පදිංචිය සියළු ලේඛණානුකූලව තහවුරු වී ඇති බව අනාවරණය වේ. වගඋත්තර පාර්ශවය විසින් සිදු කරන ලද පළමු ස්ථාන පරීක්‍ෂාවේ දී පැමිණිලිකාරිය නිවසේ නොසිටියද දෙවන අවස්ථාවේදි පැමිණිලිකාරිය සහ ඇයගේ දියණිය නිවසේ සිටිනු පැහැදිලිවම වගඋත්තර පාර්ශවය වෙත නිරීක්‍ෂණය වී ඇත.

ප්‍රාදේශීය ලේකම්, මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉදිරිපත් කර ඇති 2018.07.11 දිනැති ලිපියට අනුව පැමිණිලි පාර්ශවයේ ස්ථිර පදිංචිය අදාළ ලිපිනයේ බව සනාථ කර ඇති බව නිරික්ෂණය වේ.

ප්‍රායෝගිකව පැමිණිලිකාරියගේ රැකියා ස්ථානය වෙනත් ප්‍රදේශයක තිබුනද ලේඛන මඟින් පදිංචිය සනාථ කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද ස්ථාන පරීක්ෂාවට අදාළ කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කර නොමැත. එසේම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2018.02.22 දිනැති පරීක්ෂණයේදී බාහිර පාර්ශයක් දක්වා ඇත්තේ පැමිණිලිකාරිය උපතින්ම එම ස්ථානයේ පදිංචි බවයි.

ඒ අනුව ලේඛනානුකූලව සහ ස්ථාන පරීක්‍ෂාවන් මඟින් පැමිණිලි පාර්ශවයේ පදිංචිය මැනවින් තහවුරු වී තිබියදීත් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ සහෝදරියගේ සහ ඇතැම් අසල්වාසීන්ගේ පදනම් විරහිත ප්‍රකාශයන් මත පදනම් වෙමින් ඇයට සම්මුඛ පරීක්‍ෂණයේදි හිමිව තිබූ ලකුණු 92 ක ඉහළ ලකුණු

ප්‍රමාණයද නොසලකා හරිමින් අවසන් නාම ලේඛනයට අදාළ දියණියගේ නම ඇතුළත් නොකිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

උක්ත කරුණු දැක්වීම සහ නිරීක්ෂණයන්ට අනුව වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඉදිරිපත්ව ඇති සියලු ලේඛන කෙරෙහි අවධානය යොමු කිරීමේදී, පැමිණිලි පාර්ශවයේ පදිංචිය තහවුරු වන බැවින්ද, අදාළ දියණිය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු 92 ක ඉහළ අගයක් හිමිකර ගනු ලැබ ඇති බැවින් ද සියලු සුදුසුකම් සපුරා ඇති මෙම පැමිණිලිකාරියගේ දියණිය වගඋත්තර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීම සඳහා මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 11.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් 1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/